# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 5 දරන සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 පෙබරවාරි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## 2012 අංක 5 දරන සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 21 වන දින]

එල්. ඩී.—ඕ.(අයි.එන්.සී.) 32/2010.

## සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් (මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍ය නැසී ගිය ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමන් විසින් පිහිටුවන ලද ආරම්භක මධ්‍ය විද්‍යාල පනස් හතරේ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත වන්නේ ය.) එම සංගමයේ අරමුණු ඵලදායි ලෙස ඉටු කර ගැනීම සහ එකී සියලු ම කාරණා පිළිබඳව එම සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීතිවලට අනුව කටයුතු කිරීම සඳහා මේ වන විටත් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන ඇති හෙයින් ද:

එකී "සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය" පිහිටුවන ලද්දේ කවර අරමුණු සහ කාරණා සඳහා ද, එම අරමුණු සහ කාරණා කිහිපයක් මේ දක්වා එම සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එම ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2012 අංක 5 දරන සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජික සාමාජිකාවන් සහ මෙම පනත මඟින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරන) "සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එම සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ අරමුණු.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වූ නැසී ගිය ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමන් විසින් පිහිටුවන ලද ආරම්භක මධ්‍ය විද්‍යාලවල ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඒකරාශි කිරීම;

(ආ) එකී මධ්‍ය විද්‍යාලවලට ම ආවේණික වූ සංස්කෘතික හා සාමාජයීය සාරධර්ම සහ සම්ප්‍රදායයන් ආරක්ෂා කොට රැක ගැනීම;

(ඇ) එකී මධ්‍ය විද්‍යාලවල ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වෘත්තීයමය හා රැකියාමය තත්ත්වයන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ඔවුන් සමග අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය සහ වෙනත් අදාළ රජයේ හා පළාත්බද ආයතන සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියා කිරීම;

(ඉ) සාමාජයික, ආර්ථික, අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතුවල නිරත වී සිටින වෙනත් අදාළ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඊ) දක්ෂ බුද්ධිමත් සිසුනට ස්වකීය සමාජයීය හා ආර්ථික තරාතිරම නොතකා ඉහළ ම අධ්‍යාපනික මට්ටමට ළඟාවීමට උපකාරී වීමේ අභිප්‍රායයෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමය ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී එකී සිසුනට ශිෂ්‍යත්ව ප්‍රදානයෙන් සහ වෙනත් ආකාරයෙන් ආධාර කිරීම;

(උ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර නමින් ආයතනයක් පිහිටුවීම;

(ඌ) එකී මධ්‍ය විද්‍යාල සමග සම්බන්ධතා පවත්වා ගෙන යාම සහ ඒවායේ අධ්‍යාපනික උන්නතිය උදෙසා දිය හැකි කවර හෝ සහායක් දීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා තොරතුරු එක්රැස් කිරීම හා බෙදා හැරීම;

සංස්ථාවේ පොදු බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ හා වසා දැමීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, දේශීය හෝ විදේශීය ප්‍රභවවලින් ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හා රැස්කර ගැනීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, දේපල අත්පත් කර ගැනීමේ හා මිල දී ගැනීමේ ද, සංස්ථාව වෙත පවරා දී ඇති හෝ සංස්ථාව විසින් අත්පත් කර ගෙන ඇති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදි කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයෙහි යෙදවීමේ හා සේවයෙන් ඉවත් කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීමට හෝ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර හෝ උචිත කවර වූ හෝ සියලු කටයුතු, කාරණා සහ සියලු දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, එම රීතිවලට ඉඩ සලසා ඇති පරිදි හා ඒ අනුව තෝරා පත් කර ගනු ලබන විධායක කමිටුවක් මගින් ඉටු කෙරෙන්නේ ය.

(2) ප්‍රථම විධායක කමිටුව මෙම ආයතනය සංස්ථාගත කෙරෙන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තනතුරු දැරූ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ මෙම පනතේ මෙන්ම වෙනත් කිසිම ලිඛිත නීතියක ප්‍රතිපාදනවලට පටහැනි නොවන කවර හෝ රීති මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් නොපැමිණි සාමාජිකයන් ද ඇතුළුව තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සම්මත කර ගැනීම නීත්‍යානුකූල වේ. එබඳු රීති, ඒ ආකාරයෙන් ම රැස්වීමක දී, ඒ ආකාරයෙන් ම වෙනස් කිරීම, සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ ඒවාට අලුතින් එක් කිරීම ද කළ හැක්කේ ය.

(2) සංස්ථාවේ සෑම සාමාජික සාමාජිකාවක් ම සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත් විය යුත්තේ ය.

සංස්ථාවේ වත්කම් සහ බැරකම්.

7. (1) මෙම පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම දිනයේ දී ආයතනයේ පැවති සියලු ම ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට ආයතනයට ගෙවිය යුතු සියලු ණය සහ සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුත්තේ ය.

(2) සාමාජිකයකුගෙන් අයවිය යුතු යාවජීව සාමාජික මුදල් හෝ වාර්ෂික සාමාජික මුදල් ඉක්ම වූ මුදල් ප්‍රමාණයක්, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා ගෙවීමට කිසිදු සාමාජිකයකු බැඳී නැත්තේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි සහ අපහරණය කළ හැකි බව.

8. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, අන්තිම කැමති පත්‍රයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපලක්, සංස්ථාවේ රීතිවලට යටත්ව භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය හා හැකියාව ඇත්තේ ය. තව ද, එවැනි සියලු දේපල මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවේ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතුවේ.

සංස්ථාවේ අරමුදල්.

9. (1) සංස්ථාවට ඊටම අයත් අරමුදලක් තිබිය යුතු අතර සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන්නා වූ ත්‍යාග, අන්තිම කැමති පත්‍රයකින් පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමට තැන්පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල්, මෙකී අරමුදල්වලින් ගෙවනු ලැබිය යුත්තේ ය.

(3) සංස්ථාවේ මුදල් හා දේපල මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් ම යෙදවිය යුත්තේ ය.

**10.** (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව සංස්ථාව විසින් නිසි අයුරින් ගණන් තැබීමට සැලැස්විය යුතු ය. ගිණුම් හා විගණනය.

(2) සංස්ථාව විසින් පත්කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සෑම වසරකදීම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව තහවුරු කළ යුත්තේ ය.

(3) මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයා:” යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර සංස්ථාවේ සභාපති සහ ලේකම් හෝ සංස්ථාව විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ වෙනත් පුද්ගලයකු ඉදිරිපිට දී විනා එය කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම අත්සන් තැබිය යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් තබනු ලබන අත්සන්වලට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

විසුරුවා හැරීම හෝ ඇවර කිරීම.

13. සංස්ථාවේ කටයුතු ඇවර කිරීමට, විධිමත් පරිදි කැඳවන ලද විශේෂ මහා සභා රැස්වීමක දී, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතරය තීරණය කරන අවස්ථාවක දී, සියලු ම ණය ගෙවා දැමීමෙන් හා වගකීම් ඉටු කිරීමෙන් පසුව ඉතිරි වන කිසියම් මුදලක් හෝ දේපලක් සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා මහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, පොදු සමාජ සේවා ආයතනයකට හෝ මහා භාරකාර තැනට පැවරිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.